සියලුම හිමිකම් ඇව්රිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# පෙරදිග සංගීතය - I

**13 ශ්‍රේණිය**

**කාලය පැය 01 යි.**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

- වඩාත් නිවැරදි පිළිතුර තෝර යටින් ඉරක් අඳින්න.

(01) සංගීතය නිර්වචනය කිරීමේදී පැරණිතම මතය වන්නේ,
(1) ගායනය, වාදනය, සංගීතය යනුයි.
(2) නාද ලක්ෂණය සංගීතය යනුයි.
(3) ගායනය, වාදනය, නර්තනය යන කරුණු තුනෙහිම එකතුවකි.
(4) ශබ්ද විද්‍යාව සංගීතය යනුයි.
(5) ශබ්ද රසය සංගීතයයි. (........)

(02) මාත්‍රා 14 කින් යුත් පක්වාජයන් වැයිමට සුදුසුතම තාලය නම් කරන්න.
(1) ජප්තාලය (2) ඒත්තාලය (3) රූපක්තාලය
(4) චෞතාලය (5) ධමාර්තාලය (........)

(03) මධ්‍යලය ගීතයක ඇති කොටස් දෙක වනුයේ,
(1) ස්වරය හා තාලයයි. (2) ස්ථායි හා අන්තරා (3) වචනය හා රිද්මයයි.
(4) ආලාප, තානාලංකාර (5) පූර්වාංග උත්තරාංග (........)

(04) සන්ධි ප්‍රකාශ රාග වල කෝමල ස්වර වන්නේ,
(1) <u>ග</u> , <u>නි</u> (2) <u>රි</u> , <u>ධ</u> (3) <u>ග</u> , <u>ධ</u> (4) <u>ධ</u> , <u>නි</u> (5) <u>රි</u> , <u>නි</u> (........)

(05) පංචතූර්ය වාද්‍ය භාණ්ඩයක් නොවන්නේ,
(1) ගැටබෙරය (2) දවුල (3) හාර්මෝනියම්
(4) තම්මැට්ටම් (5) හොරණෑව (........)

(06) හින්දුස්ථානි රූපක් තාලය සහ දෙසුළු මැදුම් තුන්තිත ට සමාන ගී පාදය තෝරන්න.
(1) ශ්‍රියා | මත්පති | උමග | නාදෙව් (2) බර | අත්ගෙන | ත | ගින්
(3) සතර | සිවුවර | බලැති | දිඩතර (4) සඳ | රැස් | ගලා | කොඳ | මල් | සලා
(5) තරු | දිලෙන | එළියෙන් | මිණි | සොයනු | බැරිවේ (........)

(07) හින්දුස්ථානි සහ කර්ණාටක සංගති පද්ධති දෙකෙහි එක් අසමානකමක් වනුයේ,
(1) පද්ධති දෙකේම ශුද්ධ සහ විකෘති ස්වරස්ථාන ප්‍රමාණයෙන් වෙනස් ය.
(2) හින්දුස්ථානි ස්වර ස්ථාන දොලහම කර්ණාටක සංගීත පද්ධතියේ නැත.
(3) හින්දුස්ථානි ස්වර නාම 12 ක් වුවත් කර්ණාටක පද්ධතියේ 16 කි.
(4) ථාට අනුව රාග වර්ග කිරීම කර්ණාටක පද්ධතියේ නැත.
(5) පද්ධති දෙකේම ආලාප ගායනය නැත. (........)

(08) රි ම ප <u>නි</u> | <u>ධ</u> <u>ධ</u> ප ප | කොටස ඇතුළත් රාගය හා ගීත වර්ගය පිළිවෙලින්,
(1) බහාර් ලක්ෂණ ගීතය (2) ජෞනපුරි සර්ගම්
(3) මාල්කෞන්ස්තරාණ (4) බ්‍රින්දාමනී මධ්‍යලය ගීතය
(5) හමීර් සර්ගම් (........)

(09) සන්නිවේදන කාරක ගැමි ගීයක් ලෙස හැඳින්විය හැකි වන්නේ,

(1) පැටව් අඬන්නේ (2) පෙර කාලේ කරපු අකුසල් පලදීලා

(3) මොහු හැර වෙන දන් දෙන්නෝ (4) බාලේ පෙම්බර

(5) වැල් කොබ්බෑවල (........)

(10) සාරංගදේව පඬිතුමා විසින රචිත ග්‍රන්ථ සංග්‍රහයක් වන්නේ,

(1) සංගීත රත්නාකරය (2) ක්‍රමික් ප්‍රස්තක්මාලිගා (3) නාට්‍ය ශාස්ත්‍රය

(4) ස්වර මේබලානිධි (5) අභිනව ගීත මංජරී (........)

- **අංක 11 - 20 දක්වා වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(11) හින්දුස්ථානි හා කර්ණාටක සංගීත පද්ධති දෙකට අයත් සුසුර වාද්‍ය භාණ්ඩ 2 ක් නම් කරන්න.

......................................................................................................................................................

(12) මුල්ම ඔපෙරාව වශයෙන් සැලකෙන කෘතිය කුමක්ද?

......................................................................................................................................................

(13) මාල්නෞන්ස් රාගයේ මේලය නම් කරන්න.

......................................................................................................................................................

(14) ප්‍රසිද්ධ එස්රාජ් වාදකයෙක් ලියා දක්වන්න.

......................................................................................................................................................

(15) කෝමල ස්වර එකක් පමණක් යෙදෙන මේජර් ස්කේලය නම් කරන්න.

......................................................................................................................................................

(16) අනාඝාතාත්මකව ගායනා කෙරෙන ගීත විශේෂ 2 ක් නම් කරන්න.

......................................................................................................................................................

(17) පහතරට වන්නමක එන කොටස් ලියා දක්වන්න.

......................................................................................................................................................

(18) සැළලිහිණියේ එන බොහෝ පැදි ගැයෙන විරිත ලියන්න.

......................................................................................................................................................

(19) දෙවියන් කරා ළඟාවීමට ඇති සංගීත ක්‍රමය කුමක්ද?

......................................................................................................................................................

(20) හටන් ගී වල දක්නට ඇති විශේෂ ලක්ෂණයක් ලියන්න.

......................................................................................................................................................

(21) Percussion Instruments වර්ගයට අයත් භාණ්ඩයකි.

(1) ඉයුපෝනියම් (2) සයිලපෝන් (3) වියෝලා

(4) බියුගල් (5) ක්‍රොම්බෝන් (........)

(22) රාගධාරී වාදන ශෛලියේ උච්චතම අවස්ථාවයි.

(1) තානාලංකාර වාදනය (2) ජලා වාදනය (3) මීන්ඩ් වාදනය

(4) අන්තරා වාදනය (5) ආලාප වාදනය (.......)

(23) පණ්ඩිත් වී. ජී. ජෝග් සහ උස්තාද් විලයත් ඛාන් දක්ෂ වන්නේ පිළිවෙලින්,

(1) එස්රාජ් වාදනයට සහ සන්තූර් වාදනයට (2) සිතාර් වාදනයට සහ වයලීන් වාදනයට
(3) සරෝද් වාදනයට සහ බටනලා වාදනයට (4) වයලීන් වාදනය සහ සිතාර් වාදනයට
(5) සන්තූර් වාදනයට සහ වයලීන් වාදනයට (........)

(24) කර්ණාට ශෛලියට අයත් නොවන ගීත ශෛලියක් වන්නේ,

(1) තිලානා (2) පදම් (3) කීර්තනම්
(4) සර්ගම් (5) වර්ණම් (........)

(25) මෝගල් යුගයේ යුග පුරුෂයා ලෙස හැඳින්වූයේ,

(1) රවි ශංඛර්ය (2) සදාරංගය (3) අමීර් ඛුෂ්රුය
(4) සාරංගදේව පඬිතුමාය (5) සංගීත රංජරී (........)

(26) තබ්ලා වාදනයක් සඳහා යොදා ගන්නා තාලයට අනුව ස්වර වාද්‍ය භාණ්ඩයකින් තාලයේ නිශ්චිත මාත්‍රා සංඛ්‍යාව අනුව වාදනය කරන නාදමාලව හඳුන්වන්නේ,

(1) ගත් නමින් ය. (2) එල්ටා නමින් ය. (3) ලෙහෙරා නමින් ය.
(4) තිහායි නමින් ය. (5) පරන් නමින් ය. (........)

(27) ප්‍රේමසිරි ඛේමදාසයන් විසින් කරන ලද නිර්මාණයකි.

(1) නල දමයන්ති (2) හංසවිලක් (3) මානසවිල
(4) ප්‍රේමතෝ ජායති ශෝකෝ (5) කරදිය (........)

(28) පක්ඛාජ් අංග හා තබ්ලා අංග තාල දෙක පිළිවෙලින්,

(1) චෞතාල් ධමාර් (2) රූපක් චෞතාල් (3) ත්‍රිතාල් ධමාර්
(4) චෞතාල් ත්‍රිතාල් (5) දාදරා එක්තාල් (........)

(29) දකුණු ඉන්දීය සංගීතයට අයත් ඝන වාද්‍ය භාණ්ඩයක් වනුයේ,

(1) වීණාවය. (2) ඝටමය. (3) නාදස්වරමය.
(4) තවිල්ය. (5) වයලීනය (........)

(30) හින්දුස්ථානි තාලයක වඩාත් ප්‍රබල ආඝාතය කුමන නමකින් හැඳින්වේද?

..................................................................................................................................

- **අංක 31 - 40 දක්වා වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(31) මප<u>නි</u><u>ධ</u>ප, <u>ධ</u>මප<u>ග</u>, රිමප යන මුඛ්‍යාංග ස්වර වලින් හඳුන්වන රාගය කුමක්ද?

..................................................................................................................................

(32) තිරිකිට යනුවෙන් දෙවරක්ම යෙදෙන හින්දුස්ථානි තාල දෙකක් නම් කරන්න.

..................................................................................................................................

(33) එක් ස්වරයකට තත් තුනක් බැගින් යෙදෙන ගත් ශෛලියේ භාරතීය සංගීත තත් භාණ්ඩය කුමක්ද?

..................................................................................................................................

(34) වන්නම් හා ප්‍රශස්ති ගායනා මෙරට පැතිර ගියේ කුමන ඓතිහාසික යුගයකද?

..................................................................................................................................

(35) බහුවිධ බුද්ධිය පිළිබඳ සිද්ධාන්තය ඉදිරිපත් කළ මනෝවිද්‍යාඥයා කවුරුන්ද?

.............................................................................................................................................

(36) දක්ෂිණ භාරතීය වර්ණම් ගායනා ශෛලියෙහි ආකෘතියට අයත් කොටස් 2 ක් නම් කරන්න.

.............................................................................................................................................

(37) බටහිර සංධවනියක ලක්ෂණයක් ලියා දක්වන්න.

.............................................................................................................................................

(38) Brass වර්ගයට අයත් භාණ්ඩ 2 ක් ලියා දක්වන්න.

.............................................................................................................................................

(39) ගසල් ගායනයේ සුප්‍රසිද්ධ සංගීතඥයින් දෙදෙනෙක් ලියා දක්වන්න.

.............................................................................................................................................

(40) තබ්ලා වාදනයක අංග 2 ක් සඳහන් කරන්න.

.............................................................................................................................................

- **හිස්තැනට සුදුසු පිළිතුර ලියා දක්වන්න.**

(41) හෙළ ගී මග ............................................................................................................ මහතාගේ කෘතියකි.

(42) රි ම ප නි | ධ ධ ප ප | ම ප ධ ප | ග ග රි ස යන සර්ගම් පාදය .................................................... රාගයට අයත් වේ.

(43) සපට්තාන් ............................................................................................................ යනුවෙන් ද හැඳින්වේ.

(44) ඒක්තාලය ...................................... වයනු ලබන අතර චෞතාලය ...................................... වාදනය කරනු ලැබේ.

(45) කැන්ටාටා ගායනා විශාල සංඛ්‍යාවක් රචනා කළ ශ්‍රේෂ්ඨ ජර්මානු සංගීතවේදියෙකි ......................................

(46) පංචතූර්ය සඳහා ඇති වෙනත් යෙදුම් 2 ක් ලෙස ...................................... හා ...................................... දැක්විය හැක.

(47) මානසවිල ඔපෙරාව ............................................................................ ශූරීන් විසින් නිර්මාණය කරන ලද්දකි.

(48) මධ්‍යමය හා ෂඩ්ජය වාදී සංවාදී ලෙස යෙදෙන උසස් පෙළට නිර්මිත රාග යුගලයක් ලෙස ...................................... හා .................................................... හැඳින්විය හැකිය.

(49) "සුරතට රැගෙන පන්දම යාගෙට ඇදුරා" .................................................... ශාන්ති කවි ගනයට අයත් වේ.

(50) ............................................................................ ගී ආඝාතාත්මකව හා අනාඝාතාත්මකව ගායනා කළ හැකිය.

The National e-learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# පෙරදිග සංගීතය - II

**13 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- **I** කොටසින් ප්‍රශ්න දෙකකටද, **II** කොටසින් එක් ප්‍රශ්නයකටද, **III** කොටසින් ප්‍රශ්න දෙකකට ද වශයෙන් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න..

---

## I කොටස

01. (i) පහත සඳහන් ස්වර ඛණ්ඩ කුමන රාග වලට අයත්දැයි නම් කරන්න.

(අ) සරිමප, නිධප, මගරි (ආ) සරිමප, නිපමරි

(ඉ) සරිස, ගමධ (ඊ) මධනිධ, මගු, මගුරිස (ල. 04)

(ii) නිෂාධය දෙයාකාරයෙන්ම යෙදෙන රාගයක් පිළිබඳ සම්පූර්ණ විස්තරයක් කරන්න. (ල. 06)

(iii) (අ) කොටසට අයත් රාගයේ මධ්‍යලය ගීතය ගීත ස්වර ප්‍රස්ථාර කරන්න. (ල. 06)

(iv) (ඊ) කොටසට අයත් රාගයට අදාළව තානාලංකාර 4 ක් නිර්මාණය කරන්න. (ල. 04)

02. නිර්දේශිත රාග කිහිපයකට අදාළ කරගත හැකි තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(a) බිලාවල් ථේලයට අයත් ඖඩව සම්පූර්ණ රාගය

(b) ධ, ගු, වාදි සහ සංවාදීව යෙදෙන ඖඩව සම්පූර්ණ රාගය

(c) ම, ස වාදි සංවාදීව යෙදෙන ඖඩව ජාති රාගය

(d) ම, ස වාදි සංවාදි වන නිෂාධය දෙයාකාරයෙන්ම භාවිතා වන රාගය

(i) ඉහත සඳහන් එක් එක් රාගය නම් කරන්න. (ල. 04)

(ii) ඉහත රාග වලට අදාළ මේල ස්වර ලියා දක්වන්න. (ල. 04)

(iii) (d) කොටසට අයත් රාගයට අදාළව ස්වර 30 කට නොඅඩු ආලාප ඛණ්ඩයක් ලියන්න. (ල. 06)

(iv) (a) කොටසට අයත් රාගයේ සර්ගමය ලියා දක්වන්න. (ල. 06)

03. භාරතීය සංගීතයේ විවිධ ගායන ශෛලීන් පිළිබඳව දැනුවත් වීම සංගීතය හදාරණ සිසුන්ට ඉතාමත් වැදගත් වේ.

(i) ධ්‍රැපද් ධමාර් ගායන ශෛලීන් පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ල. 06)

(ii) ගසල් ගායනා ශෛලියෙහි ලක්ෂණ ලියා දක්වා ගසල් ගායකයෙක් පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ල. 06)

(iii) භාරතීය අති දක්ෂ සම්භාව්‍ය සංගීත ශිල්පීන් 4 දෙනෙක් ලියා දක්වන්න. (ල. 04)

(iv) ධමාර් ගායනා ශෛලිය සඳහා යොදා ගනු ලබන තාලය නම් කර එම තාලය සම, දෙගුණ වශයෙන් ලියා දක්වන්න. (ල. 04)

## II කොටස

04. (i) සේගී නිර්වචනය කර සේගී වර්ග හඳුන්වා එහි විශේෂතා පැහැදිලි කරන්න. (ල. 07)

(ii) ප්‍රශස්ති හා හටන් ගී වල ආරම්භය, ව්‍යාප්තිය හා සුවිශේෂී ලක්ෂණ පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 07)

(iii) ප්‍රශස්ති හෝ හටන් ගීතයක් ගිත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 06)


05. (i) ගැමි ගී වර්ග හඳුන්වා එම ගී වල සංස්කෘතික පසුබිම පිළිබඳව විස්තරයක් කරන්න. (ල. 07)

(ii) උඩරට, පහතරට, සබරගමු වන්නම් වල වෙනස්කම් පැහැදිලි කරන්න. (ල. 06)

(iii) මෙහෙ ගී බොහොමයක් අනාඝාතාත්මකවීමට හේතු දක්වමින් ඔබ කැමැති අනාඝාතාත්මක මෙහෙගීයක ගීත ස්වර ප්‍රස්ථාර කරන්න. (ල. 07)

## III කොටස

06.




(i) ඉහත ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න. (ල. 04)

(ii) $B^b$ Major Scale ලියා දක්වන්න. (ල. 04)

(iii) බටහිර භාණ්ඩ වර්ගීකරණය ලියා දක්වා ඒ ඒ කොටස් සඳහා භාණ්ඩ දෙක බැගින් සඳහන් කරන්න. (ල. 04)

(iv) ඉහත ප්‍රස්තාරයේ 1, 2, 3, 4 කොටස් නම්කර කෙටියෙන් හඳුන්වන්න. (ල. 08)

07. බටහිර සංගීතයේදී ඔපෙරා සංධවනි සහ මුද්‍රා නාට්‍යවලට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි.

(i) සංධවනියක (symphony) විශේෂ ලක්ෂණ 5 ක් දක්වන්න. (ල. 05)

(ii) ඔපෙරා යනු කුමක්දැයි හඳුන්වන්න. (ල. 07)

(iii) මුද්‍රා නාට්‍යයක් තුළ සංගීතයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ල. 08)

08. භාරතීය සංගීතයේ වර්ධනය සහ විකාශය සඳහා ආගමික ගී, ශ්‍රෝත්‍රික ගී, පද්‍ය ප්‍රබන්ධ සහ සංගීතඥයින්ගේ පරිශ්‍රමය යන කරුණු හතර මූලික වී ඇති බව සංගීතඥයෝ පිළිගනිති.

(i) ආගමික ගී මූලාශ්‍ර වූ අයුරු පහත දැක්වෙන කොටස් අනුව නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

- වේද ගායනයට පසුබිම් වූ නාද ස්ථාන තිබූ බව, ඒවා ගීතිකා මත සලකුණු කළ බව.
- ස්වර ප්‍රස්ථාරකරණය පිළිබඳ ඓතිහාසික තොරතුරු සාම ගීතිකා වලින් පැහැදිලි වන බව

(ල. 12)

(ii) ශ්‍රෝත්‍රික ගී රාග නිර්මාණයේදී බලපා ඇති අයුරු පැහැදිලි කරන්න. (ල. 08)